# අල්ලස හා දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

අතීතයේ අප රටේ පැවතියේ රාජාණ්ඩු පාලනයකි. එම රාජාණ්ඩුව තුළ විවිධ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් තම රාජකාරිය ඉටු කර ඇත. ඔවුන් තමන්ගේ රාජකාරිය නියම ආකාරයෙන් ඉටු කළේය. එසේ නොවූයේ කලාතුරකිනි. තම රාජකාරිය නිසි ලෙස ඉටුනොකොට සාමාන්‍ය ජනතාවගෙන් අල්ලස් ලබා ගනිමින් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් ඊළඟ ආත්මයේ දී බල්ලන් හෝ කපුටන් වන බවට දක්වන ලද ප්‍රකාශ සෙල්ලිපිවල කොටා තැබීමට අපේ පැරණි රජවරු කටයුතු කර ඇත.
තමා ළඟට යම් කිසි කාර්යයක්, සේවාවක් ලබා ගැනීමට පැමිණෙන අයෙකුගෙන් නීතිවිරෝධී ලෙස කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් යම් කිසි මුදලක් හෝ ද්‍රව්‍යයක් ලබා ගැනීම අල්ලස ලෙස දැක්විය හැකිය. අපේ රටේද අතීතයේ සිට අතීතයේ සිට සමාජය තුළ කිසියම් මට්ටමකින් හෝ අල්ලස පැවති බවට සාක්ෂි හමුවේ. අල්ලස රටේ යහපැවැත්මට බාධාවකි. එය මගින් එම ක්ෂේත්‍රය තුළ සියලු අංශ අපකීර්තියට ලක් වෙයි. ජනතාව අතර මෙම අපකීර්තිය පැතිර යාමෙන් එම සේවය පිළිබඳව සමාජය තුළ පවතින ගෞරවය, අභිමානය, විශ්වාසදායී බව නැති වී සැකය, අගෞරවය මතුවෙයි. රාජ්‍ය සේවය තුළ පමණක් නොවේ. "අල්ලස" සමාජයේ විවිධ ක්ෂේත්‍ර පුරා පැතිර ගොස් හමාරය.

අල්ලස යනු නීතිය විසින් ප්‍රකාශ කරන ලද දඬුවම් ලැබිය හැකි සමාජය විසින් පහත් ක්‍රියාවකැයි අනුමත කළ තම රැකියාවේ ගෞරවය, අභිමානය තමා විසින්ම නැති කර ගන්නා අනුවණ, මෝඩ, නිවට ක්‍රියාවකි. එයට නීතියෙන් ලැබෙන දඬුවම්ද විශාලය. මේ බව නොදත් හෝ මේ පිළිබඳව දැනගත් මුදල්වලට, ලාභප්‍රයෝජනවලට ආශා කරන පුද්ගලයින් අල්ලස මගින් මුදල් උපයයි. එය ඉතා පහත් සමාජයට නොගැළපෙන ක්‍රියාවකි. අල්ලස් ලබා ගන්නා පුද්ගලයා කෙදිනක හෝ නීතියේ රැහැනට හසුවෙයි. එසේ හසුවීමෙන් පසු ඔහු විසින් අල්ලස මගින් උපයාගන්නා සියලු මිල මුදල් අපතේ යයි. තමාට හිමි රාජකාරිය සිදුකරමින් සමාජයට යහපත් සේවාවක් උදාකරන පුද්ගලයාට මෙය සිදුනොවේ. ඔහුට හිමි වන්නේ ප්‍රශංසාවමය.

යම් කිසි සේවයක ගුණාත්මකභාව අඩුකරන එක් හේතුවක් ලෙස අල්ලස පෙන්වා දිය හැකිය. මෙම කාර්යය හේතුවෙන් සමාජය අයහපත් මාර්ගයක් වෙත පන්නාගෙන යයි. අද අපේ සමාජය තුළ නිලධාරියාගෙන් පාරිභෝගිකයා හට නිලධාරියාට ලැබෙන වැටුපට සරිලන ලෙස පාරිභෝගිකයා හට සේවාවක් සපයන ස්ථාන හමුවන්නේ ඉතා අඩුවෙනි. නිලධාරීන්ගේ ඇස යොමු වී තිබෙන්නේ සාමාන්‍ය ජනයාගේ ගැටලු පිළිබඳව නොවේ. බහුව අවශ්‍ය වන්නේ ඉහළ වැටුපක්, උසස්වීමක් හෝ වෙනත් තමන්ට වාසිදායක වන අන්දමේ දෙයකි. මේ අතරම අල්ලස් ලබා ගැනීමෙන් තෘප්තිමත් වන මොවුන් ජනතාවට සේවය සපයන්නේ ඉතා අල්ප වශයෙනි. රටක සංවර්ධනය ඇනහිටී-මට මෙය ප්‍රබල බාධාවක් වනු නොඅනුමානය. සංවර්ධනය වෙමින් පවතින රටකනම් මෙහි බලපෑම ප්‍රබල ලෙස සැල්ලවෙයි.

රට පුරා මෙබඳු ව්‍යසනයක් ඇතිකරන අල්ලස සම්පූර්ණයෙන්ම දුරලා දැමීමට වර්ධනය කිරීමට අපේ රටේ රජය විසින් ප්‍රථමයෙන්ම දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කළ යුතු වේ. රාජ්‍ය සේවකයන් ද පිළිබඳව නිසි ලෙස දැනුවත් කළ යුතු වෙයි, එහි අනිසි විපාක පිළිබඳව ඔවුන්ට වටහා දිය යුතුයි. ඒ සමගම අනෙක් පොදු මහජනතාවද අල්ලස් ලබා ගන්නා පුද්ගලයන් හා අල්ලස පිළිබඳව පුළුල් ලෙස දැනුවත් කළ යුතු වෙයි. අපේ රටේ අතීත මහජනතාව හා නීතිය ක්‍රියාත්මක කෙරෙන අංශද අල්ලස් ලබාගන්නා පුද්ගලයන් හට නිසි දඬුවම් ක්‍රියාත්මක කරදීය.

අප රටේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවෙන් පාලනය කෙරෙන කාලය තුළ රාජ්‍ය සේවකයන් අතර තනතුරු ලබා ගැනීමට හා තවත් කටයුතු සඳහා ඇතැමුන් අතර අල්ලස් මගින් ගනුදෙනු සිදුවී ඇත. එය මුදලින් පමණක් නොව විවිධ ආකාරවලින් සිදුවී ඇත. එම ක්‍රමය නිසා එකළ පැවති රජය පිළිබඳව එම සමාජය තුළ විශාල පිළිකුලක්, අප්‍රසාදයක් හා අපකීර්තියක් පැතිර තිබුණි.

අල්ලස යන මුදල් අකුමිකතාව අප රට සමාජය තුළින් එහා මෙහා තුරන්කර දැමුවහොත් අප රට තුළ සියලු සේවාවන් අතර විශ්වාසදායී බවක් ඇති වෙයි. මෙම විශ්වාසදායී බව දිගටම පවතුනහොත් ජනතාව අතර එම සේවාවන් අතර පැහැදිලි නිරවද්‍යතාවයක්. යථාවබෝධයක් ඇති වී සමාජයද සංවර්ධනය වී සේවාවන්ගේ කාර්යක්ෂමතාවද ඉහළ නැංවී රාජ්‍ය හා පෞද්ගලික අංශද වෙනසක් නොමැතිව සංවර්ධනයට භාජනය වී එම සහයෝගීතාව හේතුවෙන් රටද සංවර්ධනයට භාජනය වී ආර්ථික, සමාජීය හා දේශපාලන අංශද දියුණු වී දියුණු තියුණු වෙයි. අල්ලසට සහභාගී වන දරුණු කුමන්ත්‍රණකාරී මිනිසුන් කෙසේ හෝ අප නීතියේ රැහැනට අල්ලා ගත යුතුය. ඔවුන් තමන් මෙන් ක්‍රියා කර වර්ධනය වන සම්පත් විනාශ කරන ජනතාව රවටන තමන්ගේ පොකට්ටුව පමණක් පුරවා ගන්නා ආත්මාර්ථකාමී ධනලෝභී මිනිසුන්ය. අප හැම දෙනාම සහයෝගයෙන්, සමගියෙන් හා සංවිධානාත්මකව කටයුතු කළහොත් මෙම අල්ලස් ගන්නා පුද්ගලයන මේ සමාජයෙන් මුලමනින්ම අතුගා දැමිය හැකිය. ක්‍රමයෙන් මෙම අල්ලස් ලබා ගන්නා අවස්ථාවේ ඔවුන් හසුකරගත යුතුය. කෙසේ හෝ නීතියේ රැහැනට හසු කරගත යුතු මොවුන්ට යළි එවැනි වරදක් සිදු නොකරන අන්දමට දඬුවම් දිය යුතුය.

මෙම අල්ලසට සහභාගී වන දෙපිරිසක් සමාජයේ ඇත. පළමු පිරිස අල්ලස් දී තම කටයුතු ඉටුකරගන්නා පිරිසක් ලෙසද අනෙක් පිරිස තමාට ලැබෙන අල්ලස් ලබාගෙන කටයුතු කරන පුද්ගලයන්ද වෙයි. මෙම දෙපිරිසම වැරදි කරුවන් වෙයි. එමනිසා මෙම දෙපිරිසම නීතිය ඉදිරියේ වැරදිකරුවන් ලෙසට ඔප්පු වෙයි. අල්ලස නැවැත්වීමටනම් මෙම දෙපිරිසම නැවැත්විය යුතුය.

මෙයින් පැහැදිලි කරන අන්දමට සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශවල සියලු නිලධාරීන් මෙම ක්‍රියාව නොකරයි. නමුත් සමාජයේ යම් කිසි කොටසක් මෙම ක්‍රියාව එකදිගටම ව්‍යාපාරයක් මෙන් පවත්වාගෙන යයි. අතීතයේ සිට වර්තමානය දක්වා පරීක්ෂා කර බැලුවහොත් අල්ලස හේතුවෙන් නීතියට හසු වූ හෝ අල්ලස නිසා අසරණ තත්වයට පත් සාමාන්‍ය මිනිසුන් බොහෝ සංඛ්‍යාවකගේ තොරතුරු සොයා ගත හැක. අල්ලස් ගැනීමට මිනිසුන් උත්සුක වන්නේ මුදල්වලට ඇති තණ්හාව නිසා බව පැහැදිලිය. මේ අන්දමින් සෑම තැනම අල්ලස පැතිර ගියහොත් කුමක් සිදුවේද? ජනතාව වෙනුවෙන් සේවය කිරීමට කිසිවෙක් නොමැතිව සියල්ලම ධනපතියන් අතරේ පමණක් සිදුවන ගනුදෙනු ඉදිරි අනාගතයේදී ඇතිවේ. අල්ලස පිළිබඳව අප නොතරම් දුරට කිනම් ආකාරවලින් හෝ සමාජය තුළ තනිකාමන් ඇති කලත් එය සකසා ගත යුත්තේ පළමුවෙන්ම අල්ලස් ලබා ගැනීමට ආශා කරන පුද්ගලයා තුළය. නිරන්තරව සේවයේ යෙදෙමින් මහන්සි වී කටයුතු කිරීමෙන් සෑම පුද්ගලයෙකුට තම රැකියාව තුළ ඉහළ මට්ටමකට පැමිණීමේ හැකියාවක් පවතී. එසේ කටයුතු කරමින් යන විට අල්ලස යන වචනය පවා සමාජයෙන් ගිලිහී යාවී

## අල්ලස් ලබා ගැනීමේ ක්‍රියාවලිය

රාජ්‍ය සේවයේ මෙන්ම පෞද්ගලික අංශයේද දක්නට ඇත. උදාහරණයක් ලෙස ගතහොත් රියදුරු බලපත්‍රයක් නොමැතිව මහා මාර්ගයේ ධාවනය කෙරෙන රථයක් පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් විට රියදුරු විසින් දඩකොළයක් ලබා නොගෙන සංජුවම පොලිස් නිලධාරියා හට මුදල් ලබා දෙන්නේත් එම මුදල් ලබාගන්නේත් මෙම ක්‍රියාවලිය අල්ලස යන වචනය අර්ථගැන්වෙන ක්‍රියාවක් බවට පත්කරයි. මෙය සෑම පොලිස් නිලධාරියෙක්ම නොකරන බව වටහා ගත යුතුය. අප රටේ පවතින නීතිය නිසිලෙස ක්‍රියාත්මක නොවීමද මෙම අල්ලස සුලභ ලෙස ව්‍යාප්ත වීමට බලපා ඇත. ජනතාවට සේවය සපයන නිලධාරීන් හරපන්නේ මුදල් මත නම් එහි කිසිදු වටිනාකමක් නොමැත. එය පිළිබඳව කිසිදු විශ්වාසයක්ද නොමැතිව යයි. අල්ලස් මගින් ලබා ගන්නා මුදල් කිසිදු අර්ථයක් නොමැති කිසිදු හරයක් නොමැති මුදල් වේ. අප රටේ විශ්වාසදායී සේවාවන්හිද අල්ලස සිදුවුවහොත් ජනතාවගේ සාපය උත්සන්න වී

අල්ලස නීතිවිරෝධී කටයුත්තකි. එම නිසා අප කුමන මොහොතක කුමන ස්ථානයකදී වුවද අල්ලස දුටු තැන නීතිය දැනුවත් කළ යුතුය. එවිට නීතිය අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. මෙම අල්ලස නිසා රටේ සංවර්ධනයට යෙදවිය හැකි මුදල් විශාල ලෙස අපතේ යයි. මෙය රටක් ඉහළ දියුණුවක් කරා යෑමේදී දුබල ලෙස බලපායි. මෙම ලෝකයේ යම් දෙයක් පිළිබඳ විශ්වාසයක් නොවන දෙයක් විය යුතුය. මුදල් ගරානම්ශ නාම ඇතැම්විට අයහපත්ය. මුදල් කෙරෙනකුට දියුණුවක් ලබා කරන අතරම තවත් කෙනෙකුගේ පරිහානියට හේතු වෙයි. අල්ලස මගින් සිදුවන්නේද මෙයමය.

සමාජයට හානි කරන මෙවන් අල්ලස් හා දූෂණය වංචා ඇති පුද්ගලයන් ශ්‍රී ලංකාව තුළින් තුරන් කිරීම මගින් ශ්‍රී ලංකාව පිරිසිදු, පිරිපුන් සම්පත්වලින් බහුල ධනවත් රටක් වන බවට නොඅනුමානය. එම සිහිනය සැබෑ කර ගැනීමට ආත්මාර්ථකාමී පටු ධනකාමී අදහස් සිදු නොකර සිටිය යුතුය. එමගින් සේවය පිළිබඳ ජනතාව තුළ විශ්වාසයක් ගෞරවයක් ඇති වී අවිශ්වාසී බව නැති වී යයි. එමගින් එම සේනාවද දියුණු වෙයි. එමගින් එම සේවාවේ ගුණාත්මකතාවයද වැඩිවෙයි. අල්ලස සමග එකට බැඳී වචනයක් ලෙස වත්මන වන විට දූෂණය නම් වූ වචනයද එකට සංයෝජනය වූ වචනයක් ලෙස බැඳී පවතී. රාජ්‍ය සේවය තුළ මුදල් අක්‍රමිකතා මුදල් අවභාවිතා කිරීම හා තවත් වැරදි කිහිපයක් දූෂණ වංචා ගනයට ගැනේ. දූෂණය සමාජය පිරිහීමකට භාජනය කරන සමාජ අවමානයට ලක්වන කාරණයකි. වර්තමානය වන විට රාජ්‍ය හා පෞද්ගලික අංශයන් තුළ දූෂණ වංචා ඔත්තුවෙන් සිදුවන ගැටලු ඇය හා සම්බන්ධව. නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විශාල වශයෙන් කතා බහට ලක්වෙයි.

දූෂණයෙන් පිරි දූෂිත රටක් අපිරිසිදුය.

එම අපිරිසිදු බව රටේ සෑම කෙනෙකුටම අහිත-කරය. දියුණුවට බාධාවකි. දූෂණ වංචා මගින් රටේ සංවර්ධනයට යෙදවිය හැකි මුදල් සම්පත් හෝ පුද්ග-ලයෝ විනාශ වී යති. මෙය මහත් වූ ඛේදවාචකයකි. එය සමාජ පරිහානියකි. සමාජයට ඇත්ත මුහුණ නොපෙන්වා වෙස් මුහුණු පළඳගෙන සිටින ඇතැම් මිනිසුන් මෙම පහත් ක්‍රියාවට සම්බන්ධ වෙයි. මෙම දූෂණ වංචාවලට අනුබල දෙන තමන්ගේ වාසියට කටයුතු කරන බොහෝ දෙනෙක්ද මේ සමාජයේ වෙසෙති. ඔවුන් විවිධ තරාතිරමේ විවිධ පුද්ගලයන් වෙයි. ධන ලෝභී ආශාවන්ගෙන් පෙළී තම ජාතික කතිය අමතක කර තම අරගංචවය තමා විසින්ම ඇති කර-ගෙන කටයුතු කරන මෙම දූෂකයන් හා අනුබලදෙන්න-න් නිසා වසරකට රටකට අහිමි වන සම්පත් හා රට ජය වන ප්‍රතිඵලය ඉහළ යයි. තමාගේ තුට සාලසුම 1 - 20
ක්‍රියාවට නැංවීමට අන් කිසිදු දෙයක් නොතකා කටයුතු 2 - 22
කරන මොවුන් සැබවින්ම ආත්මාර්ථකාමීහුය. මොවුන් 3. 18
වහ වහාම සමාජයෙන් ඉවත් කළ යුතුය.

4 - 17
77

සමාජයට හානි කරන මෙවන් අල්ලස් හා දූෂණ වංචා ඇති පුද්ගලයන් ශ්‍රී ලංකා-ව තුළින් තුරන් කිරීම මගින් ශ්‍රී ලංකාව පිරිසිදු, පිරි-පුන් සම්පත්වලින් බහුල ධනවත් රටක් වන බවට නොඅනුමානය. එම සිහිනය සැබෑ කර ගැනීමට ආත්-මාර්ථකාමී පවිටු ධනකාමී අදහස් වල නොතාවළී සිට කිසිවෙකුත් දූෂණ වංචා අල්ලස් සිදු නොකර සිටිය යුතුය. එමගින් සේවය පිළිබඳ ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙයි. එමගින් එම සේවාවේ අවිශ්වාසී බව නැති වී යයි. එමගින් එම සේවාවද දියුණු වෙයි. මෙමගින් රට සංවර්ධනය වීමට මුල් පියවර තබන ශ්‍රී ලංකාව දූෂණයෙන්, වංචාවෙන්, අල්ලසින් තොර ඉතිරියෙන්, සහයෝගයෙන්, විශ්වාසයෙන් පිරිපුන් සමෘද්ධිමත් රටක් ලෙස ඉදිරියේදී බැබලේවි